# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන  ආයතනික හා පාසල් විභාග සඳහා සම්බන්ධීකරණ නිලධාරි /ශාලාධිපති  පුහුණු සංචිතය සඳහා නිලධාරින් තෝරා ගැනීම.**

1. යථෝක්ත පුහුණු සංචිතයට තෝරා ගැනීම සඳහා පළාත් / කලාප / කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයක හෝ රජයේ පාසල්වල දැනට සේවයේ නියුතු, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ / ශ්‍රී ලංකා ගුරු සේවයේ වෘත්තිකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. සපයා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය අනුව A4  ප්‍රමාණයේ කඩදාසි භාවිත කර පරිගණකයෙන් මුද්‍රිත හෝ පැහැදිලි අත් අකුරෙන් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර **2013 පෙබරවාරි 18** දින හෝ ඊට පෙර පහත ලිපිනයට එවිය හැකි වන පරිදි ඔබේ ආයතන ප්‍රධානියාට බාර දෙන්න .

   විභාග කොමසාරිස් ජනරාල් .
   සැලසුම් ක්‍රියාත්මක කිරීම හා නියාමන ශාඛාව
   ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
   තැ.පෙ 1503 - කොළඹ .

   ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"විභාග පරිපාලන කාර්ය මණ්ඩල පුහුණු සංචිතය "**යනුවෙන් සඳහන් කළ යුතු වේ.

**2.** ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් ලේඛනවල සහතික කළ පිටපත් එවිය යුතුය.

   1. ජාතික හැඳුනුම්පත
   2. මුල් පත්වීමේ ලිපිය
   3. වර්තමාන තනතුරට අදාළ පත්වීම් ලිපිය
   4. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්
   5. භාෂා හැකියාව ට අදාළ සුදුසුකම්

**3.** ඉදිරි පාසල් විභාග සහ ආයතනික විභාගවල ඉහත දක්වා ඇති තනතුරු සඳහා පත් කරනු ලබන්නේ මෙම සංචිතයට ඇතුළත් කර පුහුණු කරනු ලබන අය අතුරෙන් බැවින් ඉහත විභාග රාජකාරිවල නිරත වීමට අපේක්ෂා කරන නිලධාරින් අනිවාර්යයෙන්ම මේ සඳහා ඉල්ලුම් කළ යුතුය. ඒ අනුව ඉදිරි සියලු විභාගවල ඉහත දක්වා ඇති විභාග කාර්යමණ්ඩල සඳහා පත්කරනු ලබන්නේ මෙම සංචිතයට ඇතුළත්ව පුහුණුව ලැබූ අය පමණක් වේ.

**4.** සුදුසුකම් අනුව තෝරා ගන්නා නිලධාරින්ට විභාග සංවිධානය පිළිබඳ ප්‍රාදේශීය මට්ටමින් පුහුණු වැඩ සටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම පුහුණු වැඩසටහන් 2013 මාර්තු මාසයේදී ආරම්භ කිරීමට නියමිතය. මෙම සංචිතයට තෝරා ගන්නා නිලධාරීන්ට පුහුණුව පැවැත්වෙන දිනය හා ස්ථානය කල් වේලා ඇතිව දන්වා එවනු ඇත.

**5.** සම්බන්ධීකරණ නිලධාරි තනතුරු පැය 24 පුරාම අදාල සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ නතරවී පූර්ණ කාලීනව සේවයේ නිරත විය යුතු බැවින් ඒ සඳහා කැමති හා පූර්ණ කාලීනව සේවයේ නිරත විය හැකි පිරිමි පක්ෂයේ නිලධාරින් පමණක් ඉල්ලුම් කල යුතුවේ.

6. ඉල්ලුම් කිරීමේ මූලික සුදුසුකම්.

6.1 විභාග රාජකාරි කටයුතු තහනම් කළ අයකු හෝ තාවකාලිකව විභාග කටයුතු අත්හිටවූ අයකු හෝ නොවීම

6.2 කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර නොමැති අයකු හෝ 2013/01/01 දිනට පෙරාතුව වසර 5ක කාලයක දී විනය ක්‍රියාමාර්ග හේතු කොට ගෙන දඬුවමක් ලබා නොමැති අයකු හෝ වීම

7. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

7.1 සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා

7.1.1 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තනතුරක ස්ථිර කර ඇති නිලධාරියකු වීම හෝ ශ්‍රී ලංකා ගුරු සේවයේ I පන්තියේ වසර 8ක සේවා කාලයක් සපුරා ඇති අයකු වීම

7.2 ශාලාධිපතිවරුන් සඳහා

7.2.1 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ / ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ / ශ්‍රී ලංකා ගුරු සේවයේ I පන්තියේ තනතුරක් දරන අයකු වීම

හෝ

7.2.2 ශ්‍රී ලංකා ගුරු සේවයේ II – I පන්තියේ / II – II පන්තියේ තනතුරක වසර 3ක සේවා කාලයක් සපුරා ඇති උපාධිධාරියකු වීම හෝ වසර 5ක සේවා කාලයක් සපුරා ඇති පුහුණු හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරි ගුරුවරයකු වීම

8. පුහුණු සංචිතය පිහිටුවීම හා සම්බන්ධ සියලු කරුණුවලදී විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

**ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර**
විභාග කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල
2013.01.28

## ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. ඔබ ඉල්ලුම්කරන තනතුර අදාල කොටුව තුළ ✕ ලකුණ යෙදීමෙන් දක්වන්න. සම්බන්ධීකරණ නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් කල හැක්කේ නියමිත සුදුසුකම් සපුරාලන පිරිමි නිලධාරින්ට පමණි.

2. (අ) ආමන්ත්‍රණ පදය (Title) ඉදිරියේ ඇති අදාළ කොටුව තුළ ✕ ලකුණ යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න.
   උදා :- A.B.C.PERERA

   (ආ) මුලකුරුවලින් හැදින්වෙන නම/නම් ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න. (නම් දෙකක් අතර කොටුවක් හිස්ව තබන්න)

   (ඇ) සම්පූර්ණ නම සිංහලෙන් ලියන්න.

   (උ), (ඌ), (එ) තොරතුරු ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න.

   (ඌ) සහ (එ) යටතේ ආසන්න නගරය හා සේවය කිරීමට කැමති නගර තෝරා ගැනීමේදී, දී ඇති නගර අතුරින් තෝරා ගන්න.

3. ඔබේ පෞද්ගලික හා රාජකාරි ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න. වචන අතර කොටුවක් බැගින් හිස්ව තබන්න.

4. (අ), (ආ) සහ (ඇ) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න.

5. ඔබ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් සඳහන් කර පිටපතක් අමුණන්න.

6. ඔබ ලබා ඇති ඉහළම වෘත්තීය සුදුසුකම් සඳහන් කර පිටපතක් අමුණන්න.

7. (අ). සිංහල = S, දෙමළ = T, ඉංග්‍රීසි = E අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.

   (ආ). ඔබේ මවු බසට අමතරව වෙනත් භාෂාවලින් වැඩකිරීමේ හැකියාව සඳහන් කරන්න. සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලට අමතරව වෙනත් භාෂාවක් දන්නේ නම් ඒ කුමන භාෂාවද යන්න තිත් ඉරමත සඳහන් කරන්න.

8. (අ) සහ (ආ) සම්පූර්ණ කිරිමේදී පහත තනතුරු එකක් හෝ කිහිපයක ඔබේ පළපුරුද්ද සඳහන් කරන්න.
   1. සම්බන්ධීකරණ නිලධාරි
   2. සහකාර සම්බන්ධීකරණ නිලධාරි
   3. ශාලාධිපති
   4. සහකාර ශාලාධිපති (නිත්‍ය නිරීක්ෂක)
   5. ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලක
   6. ඇගයීම් මධ්‍යස්ථාන සහකාර පරිපාලක
   7. ප්‍රාදේශීය එක්රැස්කිරීමේ මධ්‍යස්ථාන පරිපාලක
   8. ප්‍රාදේශීය එක්රැස්කිරීමේ මධ්‍යස්ථාන සහකාර පරිපාලක

**පාසල් විභාග යටතේ,**

1. අ.පො.ස (සා.පෙළ) විභාගය
2. අ.පො.ස (උ.පෙළ) විභාගය
3. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය
4. සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය (GIT)

(ආ) **වෙනත් විභාග,**

1. දේශීය විභාග : විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන බඳවා ගැනීම්, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග, සහතික පත්‍ර විභාග (උදා :- දහම් පාසල් අවසාන, ගුරු විදුහල් අවසාන ) වැනි විභාග අදහස් වේ.

2. විදේශීය විභාග : විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන CIMA, CIM, ACS, NCC ආදී විදේශීය ආයතන හෝ විදේශීය විශ්ව විද්‍යාල වෙනුවෙන් පවත්වනු ලබන විභාග අදහස් වේ.

9. ඔබේ මනාපය කොටුව තුළ ✕ ලකුණ යෙදීමෙන් සඳහන් කරන්න.

10. (අ),(ආ) සහ (ඇ) හි අදාළ කොටුව තුළ ✕ ලකුණ යොදන්න.

**අංක 1 - 10 දක්වා අසා ඇති තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඔබේ සහතික කරන නිලධාරියාට / ආයතන ප්‍රධානියාට බාරදෙන්න.**

12. **සහතික කරන නිලධාරියා යනු :**

- ඔබ ගුරුවරයකු හෝ නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයකු නම් විදුහල්පතිවරයා ද
- ඔබ ගුරු උපදේශකවරයකු හෝ විදුහල්පතිවරයකු නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා ද
- අනෙකුත් නිලධාරින් සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානියා ද වේ.

**සහතික කරන නිලධාරින් /ආයතන ප්‍රධානින්ට උපදෙස් :**
ඔබට ලැබෙන ඉල්ලුම්පත්‍රයේ අංක 12 යටතේ අසා ඇති රහස්‍ය නිර්දේශ ලබා දෙන්න. එක් එක් අයදුම්කරු සම්බන්ධයෙන් වෘත්තීමය නිර්දේශයන් (Professional Recommendations) ඔබ ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉන්පසු සියලුම ඉල්ලුම් පත්‍ර උපලේඛන ගත කොට ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට එවන්න.

**විභාග කොමසාරිස් ජනරාල් .**
**සැලසුම් ක්‍රියාත්මක කිරීම හා නියාමන ශාඛාව**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. - 1503, කොළඹ .**